ඔබට සපයා ඇත. මෙම මිශ්‍රණයේ ඇති නයිට්‍රජන් ප්‍රතිශතය ඔබ නිර්ණය කරන්නට තැත් කරන්නේ කෙසේදැයි සංක්ෂිප්තව දක්වන්න.

සැ. යු. පරීක්ෂණාත්මක විස්තර අවශ්‍ය නැත.

ඉවහල: ජලීය ඇමෝනියම් ද්‍රාවණයක් නැවවූ විට $NH_3$ පහසුවෙන් ඉවත් වේ.

11.(a) කෝස්ටික් සෝඩා නිෂ්පාදනය කිරීම සඳහා පරන්තත්හි භාවිතා කරන ලද ක්‍රමය හා සම්බන්ධ වන භෞත - රසායනික මූලධර්ම පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ලියන්න.

සැ. යු.ඉතාමත්ම වැදගත් වන අංශ 8ක් පමණක් සලකා බැලීම ප්‍රමාණවත් වේ.

(b) කෝස්ටික් සෝඩා නිෂ්පාදනයෙන් ලබා ගත හැකි අතුරුඵල වල ප්‍රයෝජන 4ක් සඳහන් කරන්න.

(c) (i) යකඩ තිබෙන ලෝපස් 2ක නම් ලියන්න.

(ii) යකඩ නිෂ්පාදනය නිසා සිදු වී ඇති පරිසරය දූෂණය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

සැ. යු. වැදගත් දූෂක 4කට අදාළව ඔබගේ අදහස් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

12.(a) ඇමෝනියා කාර්මිකව නිෂ්පාදනය කිරීම සඳහා උපයෝගී වන හේබර් ක්‍රමයට අදාල භෞත රසායනික මූලධර්ම සාකච්ඡා කරන්න.

සැ. යු. ඉතාමත්ව වැදගත් වන අංශ 5ක් පමණක් සලකා බැලීම ප්‍රමාණවත් වේ.

(b) (i) 'ජලයේ තාවකාලික කඨිනත්වය' යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ii) ජලයේ තාවකාලික කඨිනත්වය ඉවත් කිරීම සඳහා ඇති ක්‍රම 3ක් පැහැදිලි කරන්න.

(c) (i) ස්වභාවික රබර්වල ව්‍යුහය අඳින්න.

(ii) වල්කනයිස් කරන ලද රබර් නිදර්ශකයක ඇති සල්ෆර් ප්‍රතිශතය නිර්ණය කිරීම සඳහා ක්‍රමයක් යෝජනා කරන්න.

සැ. යු. ප්‍රායෝගික විස්තර අවශ්‍ය නොවේ.

ඉවහල : ඇතැම් සල්ෆේට ජලයෙහි අද්‍රාව්‍ය වේ.

---

## 1992 අගෝස්තු - රසායන විද්‍යාව

I කොටස

1. සෝඩියම් ඇලුමිනේට්හි රසායනික සූත්‍රය
(1) $NaAlO_3$ වේ. (2) NaAlO වේ. (3) $NaAlO_2$ වේ.
(4) $Na_2AlO_3$ වේ. (5) ඉහත සඳහන් එකක්වත් නොවේ.

2. පරමාණුක ක්‍රමාංකය 40 වන මූලද්‍රව්‍යයෙහි පරමාණුවක අන්තිම උපශක්ති මට්ටමෙහි ඇති ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව
(1) 12 වේ. (2) 10 වේ. (3) 4 වේ.
(4) 2 වේ. (5) ඉහත සඳහන් එකක්වත් නොවේ.

3. එක්තරා මූලද්‍රව්‍යයකින් සෑදෙන ඔක්සයිඩයක ස්කන්ධය අනුව 50% ඔක්සිජන් තිබේ. මූල ද්‍රව්‍යය
(1) N විය හැකිය. (2) S විය හැකිය. (3) Al විය හැකිය.
(4) C විය හැකිය. (5) ඉහත සඳහන් කිසිවක් විය නොහැකිය.

4. $C_xH_yN$ යන අණුක සූත්‍රයට අදාළව, බෙන්සීන් න්‍යෂ්ටිය ඇතිව තිබිය හැකි ව්‍යුහ සංඛ්‍යාව
(1) 3 වේ. (2) 4 වේ. (3) 5 වේ. (4) 6 වේ. (5) 7 වේ.

5. වායුමය සංයෝගයක සාපේක්ෂ අණුක ස්කන්ධය 48 වේ. සංයෝගයේ මවුලික පරිමාව ස. උ. පී. දී 20.4 $l$ වේ නම් 5°C සහ 24 atm යටතේ දී සංයෝගයෙන් 9.6 g හි පරිමාව කොපමණ වේද?
(1) 190.1 ml (2) 173.1 ml (3) 166.9 ml (4) 183.3 ml
(5) මේ පරිමාව සඳහා නිත්‍ය අගයක් දැක්විය නොහැකිය.

6. පේරුවිල යපස්වල රසායනික සූත්‍රය
(1) $Cu_2FeS_2$ වේ. (2) $CuFe_2S_2$ වේ. (3) CuS.FeS වේ.
(4) $CuFeS_3$ වේ. (5) $Cu_2FeS_3$ වේ.

7. ඉලෙක්ට්‍රෝන කදම්බයක් සම්බන්ධව වන මේ ප්‍රකාශ වලින් කුමන එක සත්‍ය වේද?
(1) එය කැතෝඩය දෙසට ආකර්ෂණය වේ.
(2) එය N - චුම්බක ධ්‍රැවයක් වෙතට ආකර්ෂණය වේ.
(3) එය S - චුම්බක ධ්‍රැවයක් වෙතට ආකර්ෂණය වේ.
(4) එය ඇනෝඩයෙන් ඉවතට උත්ක්‍රම වේ.
(5) ඉහත සියලුම ප්‍රකාශ සාවද්‍ය වේ.

8. වාෂ්පශීල සංරචක දෙකකින් සමන්විත වන ද්විසංඝි පද්ධතියක ද්‍රාව්‍යයේ මවුල භාගය
(1) $\frac{P^0 \text{ ද්‍රාව්‍යය} - P \text{ ද්‍රාව්‍යය}}{P^0 \text{ ද්‍රාවකය}}$ වේ. (2) $\frac{P^0 \text{ ද්‍රාවකය} - P \text{ ද්‍රාවකය}}{P \text{ ද්‍රාවකය}}$ වේ.
(3) $\frac{P^0 \text{ ද්‍රාවකය} - P \text{ ද්‍රාව්‍යය}}{P^0 \text{ ද්‍රාවකය}}$ වේ. (4) $\frac{P^0 \text{ ද්‍රාවකය} - P \text{ ද්‍රාවකය}}{P^0 \text{ ද්‍රාවකය}}$ වේ.
(5) ඉහත සඳහන් කිසිවක් නොවේ.

9. $CH_3CH = CHCH_2COCH_2CH_2OH$ සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය අසත්‍ය වේද?
(1) එය බ්‍රෝමීන් දියර විවර්ණ කරයි.
(2) එය ක්ෂාරීය $KMnO_4$ ද්‍රාවණයක පැහැය වෙනස් කරයි.
(3) එයට HCN ආකලනය වේ.
(4) එය අයඩොෆෝම් ප්‍රතික්‍රියාවට පිළිතුරු දෙයි.
(5) එය බේඩි ප්‍රතිකාරකය සමඟ අවක්ෂේපයක් දෙයි.

10. මින් කුමක් බ්‍රෝමීන් දියරයට එකතු කළ විට, එහි වර්ණය වර්ධනය වේද?
(1) ජලීය $SO_2$ (2) ජලීය HI (3) ජලීය $NH_3$
(4) ජලීය $H_2S$ (5) ඝන BaO

11. $CH_3CH(OH)CH(CH_3)_2$ සහ $(CH_3)_2CHOH$ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා මින් කුමක් උපයෝගී කරගත හැකිද?
(1) සාන්ද්‍ර HCl (2) නිර්ජලීය $ZnCl_2$ / සාන්ද්‍ර HCl
(3) $PI_3$ (4) $I_2$/ NaOH
(5) මින් කිසිවක් උපයෝගී කරගත නොහැකිය.

12. 'ස්පර්ශ ක්‍රමය' සමඟ සෘජුව සම්බන්ධ නොවන්නේ මින් කුමක්ද?
(1) $SO_2$ (2) $SO_3$ (3) $CO_2$ (4) $V_2O_5$ (5) $H_2O$

13. 0.04 mol $dm^{-3}$ වන හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ද්‍රාවණයකින් 25 ml ද 0.02 mol $dm^{-3}$ වන සල්ෆියුරික් අම්ලය ද්‍රාවණයකින් 25 ml ද එකට මිශ්‍ර කරන ලදී. මේ අම්ල ද්‍රාවණ දෙක සම්පූර්ණයෙන්ම විඝටනය වී ඇතැයි උපකල්පනය කරමින්, උක්ත මිශ්‍රණයේ pH අගය ගණනය කරන්න.
(1) 1.52 (2) 1.5 (3) 1.45 (4) 1.4 (5) 1.3

14. එප්පාවල ඇපටයිට්හි
(1) Ti තිබේ. (2) Al තිබේ. (3) Mg තිබේ. (4) F තිබේ.
(5) ඉහත සඳහන් කිසිවක් නැත.

15. $CH_3NH_2$ (a) $(CH_3)_2NH$ (b) $C_6H_5NH_2$ (c) $C_6H_5NHCH_3$ (d)

ඉහත සංයෝගවල භාෂ්මික ප්‍රබලතාව' පහත දැක්වෙන පටිපාටිය අනුව ආරෝහණය වේ.
(1) d < c < a < b (2) c < d < a < b
(3) c < d < b < a (4) a < d < c < b
(5) නිවැරදි පටිපාටිය ඉහත සඳහන් කර නැත.

16. $^{234}_{91}Pa$ න්‍යෂ්ටිය පළමුවෙන් බීටා අංශුවක් ද, ඊළඟට ඇල්ෆා අංශු තුනක්ද, විමෝචනය කරයි. මේ න්‍යෂ්ටික ක්‍රියාවලියෙන්
(1) $^{222}_{88}Rn$ සෑදේ. (2) $^{222}_{92}Rn$ සෑදේ. (3) $^{222}_{92}Ra$ සෑදේ.
(4) $^{222}_{86}Rn$ සෑදේ. (5) $^{222}_{86}U$ සෑදේ.

17. ඉලෙක්ට්‍රෝනයේ $\frac{e}{m}$ අගය පරීක්ෂණාත්මකව නිරවද්‍යව නිර්ණය කළේ,
(1) මිලිකන් විසින් ය. (2) ක්රූක්ස් විසින් ය.
(3) රදර්ෆර්ඩ් විසින් ය. (4) මාර්සඩන් විසින්ය.
(5) ඉහත සඳහන් කිසිවකු විසින් නොවේ.

18. මින් කුමන සංයෝගය ප්‍රකාශ සක්‍රියතාව නොදක්වයි ද?
(1) $H_2NCH_2COOH$ (2) $H_2NCH(CH_3)COOCH_3$
(3) $CH_3CH(OH)COOH$
(4) 

(5) ඉහත සියලුම ප්‍රකාශ සක්‍රිය වේ.

19. $C_3H_4F_2$ යන අණුක සූත්‍රයට අදාළ සරල - දාම ව්‍යුහ සංඛ්‍යාව
(1) 2 වේ. (2) 3 වේ. (3) 4 වේ. (4) 5 වේ.
(5) ඉහත සඳහන් එකක්වත් නොවේ.

20. උත්ප්‍රේරකයක් සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය වඩාත්ම උචිත වේද?
(1) ඉදිරි ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය වැඩි කරයි.
(2) පසු ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය වැඩි කරයි.
(3) ඉදිරි ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය අඩු කරයි.
(4) තාපදායක ප්‍රතික්‍රියාවක එන්තැල්පි විපර්යාසය අඩු කරයි.
(5) ඉහත ප්‍රකාශ කිසිවක් [illegible] නොවේ.



www.sinhalalibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

